# බණ්ඩාරගම පතහවත්ත රජමහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ජී.ඩී.ඩබ්. ප්‍රේමරත්න

පුරාවිද්‍යා හා උරුම කළමණාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
wishwa98.dulmini@gmail.com

**මුඛ්‍ය පද** - රයිගම, පතහවත්ත, ප්‍රාකාරය, අලකේෂ්වර, බලකොටුව

## හැඳින්වීම

ශ්‍රී ලංකාව යනු පුරාවිද්‍යාත්මකව අතිශය වටිනාකමක් ඇති රටක් ලෙස හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලාංකේය ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය, ප්‍රොටෝ ඓතිහාසික යුගය ඓතිහාසික යුගය ලෙසින් යුග කිහිපයකට වර්ග කළ හැක. මේ යුගයන්ට අයත් සාධක සහිත පුරාවිද්‍යාත්මක ස්ථාන ලංකාව පුරා විසිරී ඇත. මෙම යුගයන් අතරින් ඓතිහාසික යුගයට අයත් පතහවත්ත පුරාවිද්‍යාත්මක ස්ථානය පිළිබඳව මෙහි දී පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. එමෙන්ම මෙම අධ්‍යයනය සඳහා මූලික අරමුණ වූයේ විහාරයේ ස්මාරකවල පුරාවිද්‍යාත්මක අගය පැහැදිලි කිරීමයි. මෙම පතහවත්ත රජමහා විහාරය බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ පානදුර ප්‍රධාන මාර්ගයට සමීපයේ පානදුර සිට 14km ක් දුරින් පිහිටා ඇත. ඒ අනුව පතහවත්ත රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක අගය හා එහි ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක පිළිබඳව සාකච්ඡාවක් මෙහි දී සිදු කරනු ලබයි. වර්තමාන විහාරය ඉදි කර ඇත්තේ වර්ෂ 1889 දී නාරන්ගස්පිටියේ සුදස්සි හිමියන් විසින් බව වාර්තාවේ (අභයවර්ධන, 2002:115-116).

## ක්‍රමවේදය

යතෝක්ත කරුණු සාධනය කරගැනීම උදෙසා මා විසින් ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර නොවන ගවේෂණය සිදු කිරීමෙන් අනතුරුව ක්ෂේත්‍ර ගවේෂණය ද සිදු කරන ලදී. මේ අනුව ක්ෂේත්‍ර නොවන ගවේෂණය යටතේ අවට ජනතාව සමඟ කළ සම්මුඛ සාකච්ඡා සිදු කරන ලද අතර, පුස්තකාල ගවේෂණ ඔස්සේ පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයට යාමට ප්‍රථමව ඒ අවට ප්‍රදේශය සහ විහාරය පිළිබඳ මූලික අධ්‍යයනය සිදු කරන ලදි. ඉන් අනතුරුව ක්ෂේත්‍රයේ ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක අධ්‍යයනය සඳහා අදාළ පුරාවිද්‍යා පරිශ්‍රය නිරීක්ෂණය කරන ලදී.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

බණ්ඩාරගම පතහවත්ත රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය සාකච්ඡා කිරීමේ දී ප්‍රධාන වශයෙන් සාහිත්‍යයමය මූලාශ්‍ර ඔස්සේ කරුණු අධ්‍යයනය ඉතාම වැදගත් වේ. රයිගම යනු, රයිගම රාජධානිය වන බණ්ඩාරගම නගරයටත් පානදුර නගරයටත් අතර පිහිටි කුඩා ගමකි. රයිගම කෝරළය පිළිබඳව දැක්වීමේ දී රයිගම රාජධානිය පළමුවෙන් බිහි වන්නේ ප්‍රාදේශීය රාජ්‍යයක් ලෙසිනි. ඒ ගම්පොළ යුගයේ දීය. නමුත් ඊටත් වඩා පැරණි ඉතිහාසයක් රයිගමට තිබේ. අනුරාධපුර යුගයේදීත්, දඹදෙණිය යුගයේදීත් රයිගම කෝරළය ගැන සඳහන් වී ඇත (සිල්වා හා චන්ද්‍රසේකර, 2009: 67). අනුරාධපුර යුගයේ දේවානම්පියතිස්ස රජ සමයේ රජුගේ දියණියක වූ මයුරවතී කුමරියට දායාද පිණිස රයිගම කෝරළයේ නියම්ගම් භාරදෙන අවස්ථාවේ දී අනුරධපුර ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් වැලි කළයක බහා භාරදුන් බවටත් එම වැලි කළය තැන්පත් කළ ප්‍රදේශය වැලිකළ ප්‍රදේශය ලෙස හඳුන්වන බවටත් තොරතුරු වාර්තා වේ. ක්‍රි.ව. 1344 මෙරට ට පැමිණි ඉබන්බතුතා නම් මුස්ලිම් සංචාරකයාගේ වාර්තාවල සඳහන් වන්නේ අලකේෂ්වර ඇමති යටතේ රයිගම රාජ්‍ය මීට ආසන්න කලයක බිහි වූ බවයි. ඔහුට අනුව තමා දුටු අලගක්කෝනාර රටේ ප්‍රධාන අධිරාජ්‍යයෙකු ලෙස බලවත්ව සිටි බවත් ඔහු තමන්ගේ ගමන් බිමන් සඳහා අභිමානවත් සුදු ඇතෙකු යොදා ගත් බවත් ඔහු විසූ කෝනකර් හෙවත් රයිගම විසිතුරු නගරයක් බවත් කියා ඇත. කෙසේ වෙතත් 1412 දී වීදාගම මෛත්‍රී හිමිගේ මූලිකත්වයෙන් හයවන පැරකුම්බා කුමරු ඔටුනු පැළඳි අතර වසර 3ක් රයිගම

පාලනය කර පසුව කෝට්ටේ රාජධානිය පාලනය කළ හෙතෙම ශ්‍රී ලංකාව එක්සේසත් කළ අවසන් පාලකයා විය. ඉන් පසුව 1521 දී සිදු වූ විජයබාකොල්ලයත් සමඟ රාජ්‍ය කොටස් වලට කැඩී ගිය අතර එහි එක් රාජධානියක් ලෙස රයිගම හැඳින්විය හැක. මෙහි රයිගම බණ්ඩාර නම් දුර්වල පාලකයෙකු පත් වූ අතර වර්තමානයේ පතහවත්ත විහාරය බවට පරිවර්තනය කර ඇත්තේ රයිගම බණ්ඩාරගේ මාලිගයයි.

මෙම විහාර පරිශ්‍රයේ ඉදිකිරීම් හා ඇතැම් පුරාවිද්‍යාත්මක ඉදිකිරීම් ආශ්‍රිත නටබුන් දක්නට ලැබෙයි. ඒ අනුව ප්‍රධාන වශයෙන්

- පතහවත්ත ප්‍රාකාරය.
- පොකුණ.
- දිය අගල.

පෙන්වාදිය හැකිය. පතහවත්ත රජමහා විහාර සංකීර්ණය වටා ගොඩනගා ඇති මෙම ප්‍රාකාරය රයිගම් රාජධානියට අයත් වූවකි. මෙම ස්ථානයේ බලකොටුවක් තිබූ බවට ස්ථිර වශයෙන්ම කිව හැක්කේ මෙම ප්‍රාකාරය නිසාය. මෙම ප්‍රාකාරය කබොක් ගලින් නිමවා ඇත. පහතරට තෙත් කලාපයේ බහුල වශයෙන් මෙම කබොක් ගල් තැන්පතු දක්නට ලැබෙයි. මෙම ප්‍රාකාරය පිළිබඳව කෝට්ටේ යුගයේ දී මයුර සංදේශයේ 52වන කවියේ සඳහන් වේ (ලියනාරච්චි,2018). මෙම ප්‍රාකාරයේ උස අඩි 8ක්ද, පළල අඩි 6ක්ද, දිග අඩි 660ක්ද වෙයි. කාලයත් සමඟ කබොක් ගල් ඛාදනයට ලක් වී ඇති අතර මෙහි සනත්වය අදට වඩා අතීතයේ වැඩි වූ බව නිසැකය. ප්‍රභූ රාජ අලකේෂ්වර රජු යාපනය රජු හා යුධ වැදීමට පෙර එනම් 1360-1370 අතර කෝට්ටෙ බලකොටුව ඉදි කළ අවධියේ දී මෙම බලකොටුව ඉදි කරන්නට ඇතැයි අනුමාන කරයි. 1970 දී මෙය පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ රක්ෂිත ස්මාරකයක් ලෙස නම් කොට ඇත. (රජයේ ගැසට් පත්‍රය, අංක 14789, 1968).



ඵලක 01 - රජමහා විහාරයේ ඇති ප්‍රාකාරය

තවත් පුරාවිද්‍යාත්මක අංගයක් ලෙස මෙම පරිශ්‍රයේම ඇති පතහවත්ත පැරණි පොකුණ පෙන්වාදිය හැක. මෙය රාජකීයන් විසින් දිය නෑම සඳහා යොදාගෙන ඇත. පොකුණේ පාදම ලැලි අතුරා කබොක් ගලින් බැඳ නිර්මාණය කර ඇත. මෙම ඉදිකිරීමෙහි තාක්ෂණය භාවිතා කිරීමේ දී පසෙන් ලැබෙන පීඩනයට ඔරොත්තු දෙන ආකාරයට බැම් පිටතට නෙරායන ලෙස තනා ඇත. මෙම පොකුණ හෙවත් පතහ නිසා පසුකාලීනව පොකුණ තිබූ වත්ත පතහවත්ත ලෙස හඳුන්වා ඇත. මෙම ව්‍යවහාරය අතීතයේ සිට පැවතී ඇත (සුරවීර,2014:70). වර්තමානයේ මෙම පොකුණ දිගින් මීටර 24ක්ද, පළලින් මීටර 18කින්ද යුක්ත වෙයි. මෙම පොකුණ පසුව 2013 - 2014 අතර කාලයේ දී පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් සංරක්ෂණය කර ඇත.



ඵලක 02 - රජමහා විහාරයේ ඇති පැරණි පොකුණ

මයුර සංදේශයට අනුව පවුර සමඟ ගැඹුරු දිය අගලක් විය. අලකේෂ්වර විසින් බලකොටුවක් ලෙස පරිහරණය කිරීම නිසා පවුරට අමතරව දිය අගල ද ප්‍රධාන ආරක්ෂිත උපාය මාර්ගය

ලෙස යොදාගෙන ඇත. පවුරට පිටතින් තිබූ මෙම දිය අගල වර්තමානය වන විට විවිධ ස්වභාවික ක්‍රියාවලීන් හේතුවෙන් ගොඩ වී වැසී ගොස් තිබේ.

පෙර සඳහන් කළ පුරාවිද්‍යාත්මක ස්මාරකවලට අමතරව පතහවත්ත රජමහා විහාර පරිශ්‍රයෙන් තවත් පුරාවස්තු ගණනාවක් හමු වෙයි. ඒ අතර සඳකඩපහණ, වැසිකිළි පාදුකාව, ශෛලමය ඇත් හිස්, ශිලාමය පිහිල්ල, ශෛලමය පහන්, ශිලාමය සැරසිලි, ශිලාමය කුළුණු, කැසිකිලි ගල් පෙන්වා දිය හැකිය.

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම පතහවත්ත රජමහා විහාරය වූ කලී පුරාවිද්‍යාත්මක සාධක දුලභ කාල පරිච්ඡේදයක් වන ක්‍රි.ව. 15-16 සියවස්වල නිම වී ඇත. ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව විමසීමේ දී තෙත් කලාපයේ බහුලවම දක්නට ලැබෙන අවසාදිත තැන්පතුවක් වන කබොක් පාෂාණය උපයෝගි කොටගෙන බොහොමයක් ස්මාරක ඉදි කර ඇත. එමෙන්ම ලෞකික පරිහරණයක් ලෙස අලකේෂ්වර, රයිගම බණ්ඩාර වැනි රජවරුන් භාවිතා කළ මාලිගය පසුව විහාරයක් බවට පරිවර්තනය වී ඇති අතර ලෞකික ගොඩනැගිලි අංගද මේ හේතුවෙන් විහාර පරිශ්‍රයේ හඳුනාගත හැක. එමෙන්ම විවිධ සාහිත්‍යය ග්‍රන්ථවල සඳහන් වන කරුණු විහාර පරිශ්‍රයේ ඇති පුරාවිද්‍යාත්මක අංග ඔස්සේ සනාථ වෙයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අභයවර්ධනය, එච්.ඒ.පී., (2002), ***Heritage of Sabaragamuwa: Major natural, cultural and historic sites***. Sabaragamuwa Development Bank and The Central Bank of Sri Lanka.

සුරවීර, ඒ.වී., (2014), ***රාජාවලිය***, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව.

The Government Gazette notification. No:14789. 16 February 1968.

ලියනාරච්චි, ආර්.ඒ., (2018), ***මයුර සංදේශය***, සංස්කාරක, කොළඹ, සමයවර්ධන ප්‍රකාශකයෝ (පෞද්ගලික) සමාගම.

ද සිල්වා සහ චන්ද්‍රසේකර, ඩී.පී., (2009), ***Heritage Buildings of Sri Lanka***. Colombo: The National Trust Sri Lanka.